# ආගමන සමයේ නුවාතය
# දෙසැම්බර් 21

| පළමුවන කියවීම | සලමොන්ගේ ගී 2: 8–14 |
|---|---|

සලමොන්ගේ ගී පොතෙන් උපුටා ගත් කොටසකි.

*බලන්න, මා පෙම්වතා කඳු මත පනිමින් විගසින් පැමිණෙනු මට ඇසෙයි.*

අන්න, මා පෙම්වතාගේ කට හඬ, කඳු මත පනිමින් හෙල් පිට කගිමින්, බලන්න එන සැටි විගසින්. මා පෙම්වතා මුවෙකු වැනි ය. ඔහු මුව පැටවෙකු වැනි ය. බිත්තිය අයිනේ සිට ගෙන, කවුළුව දෙස බලමින් ඔහු සිටියි, ගරාදි අතරෙන් එබිකම් කරමින්, මා පෙම්වතා මා අමතමින් මට මෙසේ කී ය. "මා සුරතලිය, නැගිටින්න, මා සොඳුරිය, දැන් එන්න. සිසිර කාලය දැන් පසු වී ඇත. වැසි වරුසා නතර වී ඇත. මිහිපිට මල් පිපී ඇත. ගී ගයනා කාලය පැමිණ ඇත. කොවුල් හඬ දසත පැතිරී යත. පැසුණු දිඹුල් පල ඉදෙන විට, මිදිවැල් සුවඳ හමන විට, මා සුරතලිය නැගිට එන්න, මා සොඳුරිය, දැන් එන්න. කඳු විවරවල, හෙල් කුහර තුළ මා පරෙවි දෙන, ඔබේ මුහුණ මට දකින්න දෙන්න. ඔබේ කටකඬ මට ඇසෙන්න දෙන්න. ඔබේ කට හඬ මිහිරි ය. ඔබේ මුහුණ සෝබන ය."

*දේව වචනය මෙසේ ය.*

හෝ

| පළමුවන කියවීම | ශෙපනියා 3: 14–18 |
|---|---|

ශෙපනියා දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

*ඉශ්රායෙල්හි රජ වන සමිඳාණෝ උන් වහන්සේගේ ජනතාව අතර සිටින සේක.*

සියොන් පුරගන, සොම්නසින් ගී ගයන්න. ජෙරුසලම් වැසියෙනි, කැමොර ගසන්න. ඉශ්රායෙල් ජනයෙනි, ප්‍රීති ප්‍රමෝද වන්න. සමිඳාණෝ ඔබට විරුද්ධ ව තිබුණු තඩු තීන්දු අවලංගු කළ සේක. ඔබේ සතුරන් නෙරපා දැමූ සේක. ඉශ්රායෙල්හි රජ වන සමිඳාණෝ ඔබ සමග සිටින සේක. විපතට බිය වීමක් තවත් නැත. එදින ජෙරුසලම මෙසේ කියනු ඇත. "සියොන් නගරය බිය නොවන්න. ඔබ අත දුබල වන්නට ඉඩ නාරින්න. ඔබේ දෙවි සමිඳාණෝ ඔබ සමග

ය. ඔබට ජය අත්කර දෙන සෙබළාණෝ ය. එතුමාණෝ ඔබ ගැන ප්‍රිය මනාප වන සේක. සිය පෙමින් ඔබට නම ජීවනයක් දෙන සේක. ඔබ ගැන සොම්නස් සිතින් ගී ගයන සේක. මංගල දවසක් මෙන් ප්‍රීති වන සේක. ඔබ නින්දාව නොලබන පිණිස ඔබ අතර විනාශය පහ කරන සේක.

*දේව වචනය මෙසේ ය.*

| පිළිතුරු ගීය | ගීතාවලිය 33: 2–3, 11–12, 20–21 |
|---|---|

පිළිතුර: ධර්මිෂ්ඨයන්ගේ සමිඳාණන් කෙරෙහි ප්‍රීති සන්තෝෂ වන්න.

ගීය: වීණාව වයා හිමි තුමන් පසසන්න.
තත් දසයේ වීණාව ගෙන එතුමන්ට පැසසුම් ගීත ගයන්න.
එතුමන්ට නව ගීතයක් ගයන්න.
මහ හඬකින් දක්ෂ ලෙස වාදනය කරන්න.

එහෙත් සමිඳුන්ගේ සැලසුම් සදහට ම ද
එතුමන්ගේ සිතුවිලි පරපුරෙන් පරපුරට ද පවත්නේ ය.
සමිඳුන් තමන් දෙවියන් කොට සලකන ජාතිය ද
දෙවිඳුන් සතු උරුමය ලෙස තෝරුණු සෙනග ද ආසිරි ලද්දෝ ය.

අප හිමි තුමන් කෙරේ විශ්වාසයෙන් බලා සිටියෙමු.
අපේ පිහිටත්, පලිහත් එතුමාණෝ ය.
අප එතුමන්ගේ සුවිශුද්ධ නාමට කෙරේ විශ්වාසය තැබුවෙමු.
එබැවින් අපේ සිත් ප්‍රීතියෙන් පිනා යයි.

## සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
උදය තාරකාව වූ ද සදා ආලෝක ධාරාව වූ ද
යුක්තිය නමැති සූර්යයා වූ ද තැනැන් වහන්සේ,
වැඩමකර අඳුරෙහි ද, මරණ අඳුරෙහි ද මුළාවන්නවුන්
ආලෝකවත් කළ වැනව.
ආලේලූයා!

සුවිශේෂක ලූක් තුමාගේ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි ය.

*මාගේ ස්වාමින් වහන්සේගේ මෑණියන් මා වෙත පැමිණියා ය.*

දින ගණනකට පසු මරිය තුමිය නැගිට, ජුදා කඳුකරයෙහි නුවරකට යුහුව ගොස්, සෙකරියස්ගේ ගෙට ඇතුල් වී, එලිසබෙත් හට ආචාර කළා ය. එලිසබෙත් මරිය තුමියගේ ආචාර බස් ඇසූ කල ඇගේ කුසෙහි දරුවා ඉපිලෙන්නට වන. එවිට එලිසබෙත් ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණව, මහ හඬින් උදන් අනමින්, “ඔබ වනිතාවන් අතර අතිශයින් ආශිර්වාද ලද්දී ය. ඔබ කුස දරු ඵලය ද ආශිර්වාද ලද්දේ ය. මාගේ ස්වාමින් වහන්සේ ගේ මෑණියන් මා වෙත පැමිණීමට තරම් මම කවරෙක් ද? මක්නිසා ද, ඔබේ ආචාර හඬ මා සවන් ගත වූ කෙණෙහි ම මා කුසෙහි දරුවා ප්‍රීතියෙන් ඉපිලි ගියේ ය. ස්වාමින් වහන්සේගේ නාමයෙන් තමන් හට දුන් පොරොන්දුව ඉටු වන්නේ ම ය යි විශ්වාස කළ තැනැත්ති භාග්‍යවන්ත ය” යි කීවා ය.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*